# පරමාධිපත්‍යය හෑල්ලු නොකරමු

විපක්ෂ නායකවරයා පාර්ලිමේන්තුවට ඒම වලක්වාලීම සඳහා යම් යම් පිරිස් පාර්ලිමේන්තු මංසන්ධියේ විරෝධතා ව්‍යාපාරවල යෙදෙමින් වාහන යොදා මග හරස් කළ බවත්, ඒ පිළිබඳව විපක්ෂ නායකවරයා පාර්ලිමේන්තුවේ අවධානය යොමු කළ බවත්, කථානායක තුමා එම සිද්ධිය හෙළා දැක එය පාර්ලිමේන්තු වරප්‍රසාද කමිටුවට යොමු කළ බවත් වාර්තා විය. ඒ අතර ජනමාධ්‍යකරුවන්ට පහර දීම, විශේෂයෙන් යුධ වාර්තාකරණයට විරුද්ධව මාධ්‍යවේදීන් ඝාතනය කිරීම්, පැහැරගෙන යෑම්, නඩු පැවරීම් සිදුවෙයි. මැතිවරණ ක්‍රියාවලිය මුළුමණින්ම යුධ පිළිවෙතක් බවට පෙරළිණි. විපක්ෂ නායකවරයා සම්බන්ධ සිද්ධියේදී එයට වගකිවයුතු පුද්ගලයන් ගණනාවකගේ නම් පාර්ලිමේන්තුවේදී හෙළිදරව් කෙරුණු අතර ඒ අතර, බස්නාහිර පලාත් සභාවේ ඇමතිවරයකුගේ නමද විය. අනෙක් සිද්ධීන්වලදී ද එපරිදිම නම් ගම් සහිතව හෙළිදරව් කෙරුණු අතර ඇමතිවරු, ඔවුන්ගේ පුත්තු මෙන්ම වෙනත් ආණ්ඩු පාක්ෂික දේශපාලකයන්ගේ නම්ද ඒ අතර සම්බන්ධ ව තිබිනි.

මෙම සිද්ධීන් කවුරු කෙසේ හෙළා දක්කද ඒවා අහම්බයන් නොව දශක ගණනාවක් පුරා ගලා යන අඛණ්ඩ ප්‍රවනතාවයක් බවද අපි මතක තබා ගත යුතුය. ඒ සඳහා නිදසුන් අනන්තවත් දක්විය හැකිය.

1. ජේ.ආර්.ජයවර්ධන යුගයේ කලු ලකීලා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ නිවෙස්වලට ගල් ගසා විරෝධතා දක්වූ විට එවක විධායක ජනාධිපති කීවේ එසේ විරෝධය දක්වීම ප්‍රජාතන්ත්‍රවාදී රටක ජනතාවට තිබෙන අයිතියක් බවයි.

2. රටම පමණක් නොව ලොවම පිළිගත් මහ ඇදුරෙකු වූ එදිරිවීර සරත්චන්ද්‍ර ශූරීන්ට පහර දී මහ පාර දිගේ ඇද ගෙන ගිය පසු විධායක ජනාධිපති කීවේ සාහිත්‍යය ඉගෙනගෙන බඩ පුරවා ගත හැකිද කියාය.

3. 1977 මහ මැතිවරණයේදී විපක්ෂ නායක ධූරයට පත් ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ ඒ. අමිර්තලිංගම් මහතාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනැවිත් එය සම්මත කර ගෙන ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ මන්ත්‍රීන් හා දෙමළ ජනතාව ශ්‍රී ලාංකික සමාජයෙන් පිටමං කළේ එවක ආණ්ඩුවේ හා විධායක ජනාධිපතිගේ පූර්ණ ආශීර්වාදය සහිතවය.

4. තම පක්ෂයේ සියළු මැති ඇමැතිවරුන්ගේ ඉල්ලා අස්වීමේ ලිපි රාජ්‍ය පාලකයා විසින් ලබා ගත්තේ මෙම 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ බාල්දුවට ලක් කෙරුණු ව්‍යවස්ථාදායකයේය.

5. වෙනත් ප්‍රතිපත්ති සහිත පක්ෂයකින් තරග කර ඊට ප්‍රතිවිරුද්ධ පක්ෂයක ආණ්ඩුවක ඇමැති තනතුරු ලබන්නට හැකිව තිබෙන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව වුවත් අධිකරණයේ ජුගුප්සාජනක කටයුතු නිසාය. විධායක ජනාධිපතිගේ සවිය නිසාය.

6. මාධ්‍යවේදීන්ට හිරිහැර කිරීම, මානව හිමිකම් උල්ලංඝනය වන ලෙස මිනිසුන් අතුරුදහන් කිරීම යන ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියා වලට විරුද්ධව ආණ්ඩුව ඉතා තදින් වේදිකා තුළ විවේචනය කරන ජනතා විමුක්ති පෙරමුණ පාර්ලිමේන්තුව තුළදී ඒ සියල්ලට අනුමැතිය දෙමින් ආණ්ඩුවට පක්ෂව මසක් පාසා හදිසි නීතිය සම්මත කරගන්නට ඡන්දය දෙන්නේත්, එක්සත් ජාතික පක්‍ෂය හදිසි නීතියට විරුද්ධව ඡන්දය පාවිච්චි නොකර ආණ්ඩුවට නිහඬ සහයෝගය දෙන්නේත් මේ බාල්දු කළ පාර්ලිමේන්තුව යටතේය.

මේ පිළිබඳව දක්විය හැකි උදාහරණ එමටය. මේ සියල්ලෙන් කෙරෙන්නේ මේ රටේ විධායකය, ව්‍යවස්ථාදායක හා අධිකරණය හෑල්ලුවට ලක් කිරීමටත් වඩා මේ සියල්ලට ඉහළින් පරමාධිපත්‍යය හිමි මහජනතාව හෑල්ලුවට ලක් කිරීමය. විහින් හෑල්ලුවට පත් කළ ජනතාවක් සිටින රටක මේවා ඉතා සුළු කරුණුය. මෙවැනි සිද්ධීන් නොඉවසන්නේ නම් රටේ ජනතාව ඉතා ගැඹුරින්, බුද්ධිමත්ව සිතා බැලිය යුතු ප්‍රශ්න කීපයක් අප ඉදිරියේ ඇත.

1. බාල්දු කළ හා බාල්දු වුණු පාර්ලිමේන්තුවක් ඉදිරියටත් පවත්වාගෙන යනවාද?

2. පාර්ලිමේන්තුවම අහෝසි කර දමා සර්වබලධාරී විධායක ජනාධිපති ධූරය පමණක් තබා ගන්නවාද? (එසේ කළ හැකි නම් 225 ක් වූ මැති ඇමතීන්, ඔවුන්ගේ පවුල්, කාර්ය මණ්ඩල, එම පවුල් හා ඥාතීන් නඩත්තු කිරීම සඳහා යෙදවෙන නිශ්කාරණ වියදම් කපා හැර විශාල මුදලක් ඉතිරි කර ගත හැකි වනු ඇත.)

3. එසේත් නැත්නම් පාර්ලිමේන්තුව යළි උත්තරීතර තත්ත්වයට පත් කර ගනිමින් සර්ව බලධාරී විධායක ජනාධිපති ධූරය අහෝසි කරලීමට පියවර ගන්නවාද?

4. නොඑසේම මේ යියල්ල පසෙක ලා වත්මන් ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියා නතර කරවීම සඳහා, එම අරමුණ වෙනුවෙන් පමණක්වත් විරුද්ධ පක්ෂයේ සියළු පක්ෂ හා ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පෙනී සිටින සියළු කණ්ඩායම් එක පෙරමුණකට එන ලෙස බලකර සිටිනවාද?

දිනෙන් දින සිය පරමාධිපත්‍ය බලය හෑල්ලුවට ලක්කර ගන්නා මහ ජනතාව නොමාව මෙම ප්‍රශ්නවලට පිළිතුරු සපයා ගත යුතුය.

ස.බ.වෙල්ගම